# 5 දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස අවසානය දක්වා ශ්‍රී ලංකාව

**මධ්‍යකාලීන ලංකාවේ වැදගත් ඓතිහාසික සිදුවීම් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය ද රාජධානී මාරු වූ ආකාරය ද ජන ජීවිතයේ සිදු වූ වෙනස්කම් ද ආර්ථික, ආගමික, සාහිත්‍ය, කලාව හා ගෘහ නිර්මාණ ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ද ඉගෙන ගැනීම සඳහා මෙම ඒකකය අධ්‍යයනය කරමු.**

## දේශපාලන ඉතිහාසය

### පොළොන්නරු රාජධානිය පරිහානියට බලපෑ කාලීන හේතු

- ☞ දුර්වල පාලකයන් බලයට පත් වීම
- ☞ මහාපරාක්‍රමබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තිය
- ☞ වසංගත රෝග පැතිරීම
- ☞ කාලිංග - පාණ්ඩ්‍ය වංශික ගැටුම
- ☞ ආර්ථික පරිහානිය


මෙම සාධක අතුරින් පොළොන්නරුව රාජධානියේ පරිහානියට බලපෑ ආසන්නතම හේතුව වූයේ කාලිංග මාඝගේ ආක්‍රමණය හා කෲර ක්‍රියා කලාපයයි. මාඝගේ ආක්‍රමණයෙන් පීඩාවට පත් ජන ප්‍රධානීන්, භික්ෂූන් වහන්සේලා හා සාමාන්‍ය ජනතාව ආරක්ෂාව පතා රුහුණු රටට හා මලය රටට සංක්‍රමණය වූ බව සඳහන් වේ. ඔවුන්ගෙන් සමහරෙක් ඒවායේ පිහිටි වන දුර්ග හා ගිරි දුර්ගවලින් ආරක්ෂිත ප්‍රදේශ අගනුවර ලෙස තෝරා ගෙන අවට ප්‍රදේශ පාලන කළ හ. එසේ පාලන මධ්‍යස්ථාන පිහිටුවා ගත් කිහිප දෙනෙකු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ✦ යාපහුව | - සුභ සෙන්පති | ✦ ගෝවින්ද මලයෙහි | - බුවනෙකබාහු ආදිපාද |
| ✦ මිනිපේ | - සංඛ සෙනෙවි | ✦ දඹදෙණියේ | - තුන්වන විජයබාහු |

මාඝ සතු වූ අති ප්‍රබල යුද සංවිධානය නිසා මෙම නායකයින්ට රජරට අල්ලා ගැනීම දුෂ්කර කාර්යයක් වූ අතර ඔවුන් ඒ සඳහා සාමූහික ප්‍රයත්නයක යෙදූ බවක් ද දක්නට නැත. ප්‍රාදේශීය නායකයන් ලෙස ජනතාවගේත්, බුදු සසුනේත් රැකවරණය සඳහා ඔවුන් දරන ලද ප්‍රයත්නය අගය කළ යුතු ය.

## දඹදෙණි රාජධානි සමය (ක්‍රි.ව. 1232 - 1270)

ප්‍රාදේශීය නායකයෙක් ලෙස නැගී ආ තුන්වන විජයබාහු ක්‍රි.ව. 1232 දී දඹදෙනිය අග නගරය බවට පත් කර ගෙන රාජ්‍යත්වයට පත් විය. මායා රට එක්සත් කොට එහි දේශපාලන ස්ථාවරයක් ඇති කිරීමට තුන්වන විජයබාහු රජතුමාට හැකි විය. මාඝගේ ආක්‍රමණය නිසා කොත්මලයට ගෙන ගොස් පොළොවෙහි නිදන් කර තිබූ බුදුන් වහන්සේගේ දන්ත ධාතුව හා පාත්‍රා ධාතුව වැඩමවා ගෙන අවුත් කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල පර්වතය මුදුනේ දළදා මාළිගාවක් ඉදිකර එහි තැන්පත් කර වූ බව පූජාවලියේ සඳහන් වේ. දළදා වහන්සේ ලබා ගැනීම සිංහාසන උරුමය තහවුරු කරන්නක් වී ය.




සිතියම 5.1 - රාජධානි නිරිත දිගට මාරුවීම

### තුන්වන විජයබාහු රජුගේ සේවාවන්

- ✍ බෙලිගල දළදා මාලිගය ඉදිකරවීම
- ✍ රැකවරණය පතා විදේශගත වූ භික්ෂූන් වහන්සේලා ආපසු ගෙන්වා ගැනීම
- ✍ දඹදෙණියේ විජය සුන්දරාරාමය නමින් විහාරයක් ඉදිකරවීම
- ✍ උපසම්පදා මංගල්‍යය යළි පවත්වා සංඝ සංශෝධනයක් කරවීම
- ✍ කැලණි විහාරය පිළිසකර කරවීම
- ✍ පැරණි බෞද්ධ පොත පත නැවත ලියවීම
- ✍ වත්තල විජයබාහු විහාරය කරවීම

තෙවන විජයබාහු රජුගේ වසර හතරක රාජ්‍ය කාලයෙන් පසු දඹදෙණි රාජධානියේ බලයට පත්වන්නේ දෙවන පරාක්‍රමබාහු රජතුමා ය.

## දෙවන පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1236 - 1270)

ඔහු බෙලිගල තිබූ දන්ත ධාතූන් වහන්සේ දඹදෙණියට වැඩම කර අතිඋත්කර්ෂවත් දළඳ පූජාවක් පවත්වා මාඝගෙන් රට මුදවා ගන්නා බවට මහජනතාව ඉදිරියේ ප්‍රතිඥාවක් ද දුන්නේ ය. භාෂා ශාස්ත්‍ර, ආගම ධර්මය ආදී විෂයය පිළිබඳ මනා නිපුණතාවක් තිබූ නිසා මහ පඬිරුවනක් වූ දෙවන පරාක්‍රමබාහු රජ **"කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත"** යන උපාධි නාමයෙන් ද පිදුම් ලැබී ය. දෙවෙනි පරාක්‍රමබාහු රජතුමාට ආක්‍රමණකාරී සටන් 3කට මුහුණ දීමට සිදු විය.

1. මාඝ රජු හා පැවති යුද්ධය
2. චන්ද්‍රභානු රජුගේ ප්‍රථම ආක්‍රමණය
3. චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණය

චන්ද්‍රභානුගේ පළමු ආක්‍රමණය දෙවන පරාක්‍රමබාහු රජුගේ එකොළොස්වන රාජ්‍ය වර්ෂයේ දී (ක්‍රි.ව. 1247) සිදු වීය. මොහු (තාම්‍රලිංග දේශයෙන්) මලය අර්ධද්වීපයෙන් පැමිණි බව සඳහන් වේ. පරාක්‍රමබාහු රජුගේ බෑණා වූ වීරබාහු කුමරු මෙම සටනේ මූලිකත්වය ගෙන තිබේ. සටනින් පරාජයට පත් වූ චන්ද්‍රභානු පලා ගියේ ය.

මාඝගේ පාලනයෙන් රජරට මුදවා ගැනීම මේ රජුගේ මීළඟ ප්‍රයත්නය විය. මේ සඳහා දකුණු ඉන්දීය පාණ්ඩ්‍ය අධිරාජයාගේ උදව් ලබාගෙන ඇත. පාණ්ඩ්‍ය හමුදාවත් පරාක්‍රමබාහු රජුගේ හමුදාවත් නැගෙනහිරින් හා බටහිරින් පොළොන්නරුව වටකොට ක්‍රි.ව. 1255 දී මාඝ පරාජය කරන ලදී.

මේ රජ දවස එල්ල වූ මීළඟ ආක්‍රමණය වූයේ පළමු ව පරාජයට පත් කළ චන්ද්‍රභානු නැවතත් ලංකාව ආක්‍රමණය කිරීමයි. පාණ්ඩ්‍ය අධිරාජයාගේ උදව් ලබාගත් දෙවෙනි පරාක්‍රමබාහු ක්‍රි.ව. 1261 දී චන්ද්‍රභානු ජීවිතක්ෂයට පත් කළේ ය. මෙයට හිලව් වශයෙන් පාණ්ඩ්‍ය අධිරාජයා ජාවක රජුගේ පුතෙකු උතුරු ලංකාවේ නියෝජිතයා වශයෙන් පත්කළ බව සෙල්ලිපිවල සඳහන් වේ.



**රූපය 5.1**
**දඹදෙණිය මාළිගාවට පිවිසුම් මාර්ගය**

### දෙවෙනි පරාක්‍රමබාහු රජුගේ සේවාවන්

- භික්ෂූන්ගේ විනය නීති පිළිබඳ දඹදෙණි කතිකාවත සම්පාදනය කිරීම
- උපසම්පදා උත්සව පැවැත්වීම
- විදේශවලින් විනයධර හා ධර්මධර භික්ෂූන් වහන්සේලා ගෙන්වා ගැනීම
- කව්සිළුමිණ හා විශුද්ධි මාර්ග සන්නය යන කෘති රචනා කිරීම.

දෙවෙනි පරාක්‍රමබාහු රජුගෙන් පසු බෝසත් විජයබාහු හතරවන විජයබාහු නමින් ක්‍රි.ව. 1270 දී රජ විය. රජමාලිගාවේ සිදු වූ කුමන්ත්‍රණයකින් ඔහු ජීවිතක්ෂයට පත් විය. ඉන්පසු පළමුවන බුවනෙකබාහු රජ වී ය. මොහු ටික කලකින් යාපහුව බල කොටුවට ගොස් එහි සිට පාලන කටයුතු මෙහෙය වී ය.

**ක්‍රියාකාරකම්**

**විදේශ ආධිපත්‍යයෙන් රට මුදවා ගැනීමට දඹදෙණි පාලකයන් දැරූ ප්‍රයත්නය පිළිබඳ තොරතුරු ගොනු කර කතාවක් ඉදිරිපත් කරන්න.**

## යාපහුව රාජධානිය (ක්‍රි.ව. 1272 - 1300)

පළමුවන බුවනෙකබාහු ක්‍රි.ව. 1272 දී යාපහුව රාජධානියේ පාලකයා වීය. බෝසත් විජයබාහු රජුට පක්ෂපාතී ව සිටි වන්නි නායකයන් ද උතුරේ පෙළ ගැසෙමින් සිටි නායකයන් ද මේ රජුට පැවති අභියෝගයන් ය. මේ අභියෝග පහසුවෙන් ජයගත හැකි විය. වාර්ෂික උපසම්පදා උත්සව ආදිය පැවැත්වූ මේ රජතුමා ක්‍රි.ව. 1284 දී මිය ගියේය. එයින් පසුව මෙරට අරාජික කාලයක් ඇතිවිය. ඒ අවදියේ දී සාගත සමයක්ද පැවති බව කියවේ. මෙකල කුලසේකර නම් පාණ්ඩ්‍ය රජුගේ ආර්ය චක්‍රවර්ති නම් ඇමති විශාල හමුදවක් රැගෙන විත් යාපහුව වටලා දළද වහන්සේ රැගෙන ගිය බව මහාවංශයේ 11 වන කොටසේ සඳහන් වේ.



රූපය 5.2 - යාපහුව රාජධානිය

තුන්වන පරාක්‍රමබාහු පාණ්ඩ්‍ය දේශයට ගොස් දන්ත ධාතුව හා පාත්‍රා ධතුව ලබාගෙන ක්‍රි. ව. 1287 දී පොළොන්නරුවේ රජ වී ය. තුන්වන පරාක්‍රමබාහු පරාජය කළ දෙවන බුවනෙකබාහු කුමාරයා ක්‍රි. ව. 1292 දී යාපහුවේ රජ වී ය.අවුරුදු 7ක් යාපහුවේ සිටි මොහු පසු ව කුරුණෑගල රාජධානිය ලෙස තෝරා ගත්තේ ය.

## කුරුණෑගල රාජධානිය (ක්‍රි.ව. 1300 - 1341)

ක්‍රි.ව. 1300 දී දෙවෙනි බුවනෙකබාහු රජතුමා සිය රාජධානිය කුරුණෑගලට ගෙන ගියේ ය. ඔහුගේ ඇවෑමෙන් ඔහු පුත් හතරවන පරාක්‍රමබාහු ක්‍රි.ව. 1302 දී රජ වීය. කුරුණෑගල යුගය ප්‍රභාවත් කළ ශ්‍රේෂ්ඨ නරපතියකු ලෙස මොහු වැදගත් වේ. බුදුදහමට හා ශාස්ත්‍රීය අංශයේ දියුණුවට ඉමහත් සේවාවක් මේ රජතුමාගෙන් සිදු විය.

### හතරවන පරාක්‍රමබාහු රජුගේ සේවාවන්

- කුරුණෑගල නගරයේ දළදා මාලිගාවක් ඉදිකරවීම
- දළද වහන්සේට ආරක්ෂාවට හා නඩත්තුවට ගම්වර පූජා කිරීම
- දළද සිරිත ලියවීම
- ජාතක කතා පොත සිංහලට පරිවර්තනය කිරීමට අනුග්‍රහය දැක්වීම
- විදගම ශ්‍රී ඝනානන්ද පිරිවෙනට හා තොටගමුවේ විජයබා පිරිවෙනට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම
- මහනුවර අස්ගිරි සේනාසනය ආරම්භ කිරීම
- සිංහල බෝධිවංසය, අනාගත වංසය වැනි පොත් ලියවීම

හතරවන පරාක්‍රමබාහුගේ අවසාන රාජ්‍ය වර්ෂය ක්‍රි.ව. 1326 ලෙස සැලකුව ද මේ පිළිබඳ නිශ්චිත තොරතුරු ලැබී නැත. මින් පසු තුන්වන බුවනෙකබාහු හා සවුළු විජයබාහු යනුවෙන් රජවරුන් දෙදෙනෙකු සිටි බව සඳහන් වේ.

### ක්‍රියාකාරකම්

**කුරුණෑගල යුගයේ ශ්‍රේෂ්ඨතම රජතුමා හතරවන පරාක්‍රමබාහු රජතුමා ය. මේ රජතුමාගේ කාර්ය සාඵල්‍යය පිළිබඳ ඓතිහාසික තොරතුරු ගොනු කරන්න.**

### යාපනය ප්‍රාදේශීය රාජ්‍යය

යාපනය රාජධානිය පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය වන්නේ “යාල්පාන” වෛපවමාලෙයි හා ශේගරාස සේකර මාලෙයි යන ග්‍රන්ථයන්ය.



රූපය 5.3 - නල්ලූර් කෝවිල

දඹදෙණිය රාජධානියේ දෙවන පරාක්‍රමබාහු රාජ්‍ය කරන සමයේ ඇති වූ ආක්‍රමණයකින් පසු චන්ද්‍රභානු නැමැත්තෙකු යාපනය ප්‍රාදේශීය රාජ්‍යයේ පාලකයා ලෙස පත් කළ බව එම මූලාශ්‍රය සඳහන් වේ.

යාපනයේ විජය කුලංකෛ නමැති පාලකයා ගැන ද මූලාශ්‍රයවල සඳහන් වේ. හැම රජ කෙනෙකු ම "ශිංගෛ ආරියන්" යන්න තමාගේ නමට අගින් යොදා ගෙන ඇත. යාපනයේ ආර්ය චක්‍රවර්ති රජවරුන් දෙළොස් දෙනෙකු පාලනය කළ බව යාල්පාන වෛපවමාලෙයි කෘතියේ සඳහන් වේ.

විජය කුලංකෛ, කුලශේකර ආරියන්, වික්කිරිම ශිංගෛ ආරියන්, වරෝදයන්, මාර්තාණ්ඩන්, කුණ්වූෂණන්, වීරෝදයන්, ජයවීරන්, කුණවීරන්, කණගශූරියන්,පරරාජශේඛරන්, සංකිලි යනුවෙන් එම පාලකයෝ හැඳින්වෙති.

මින් වරෝදයන් රජු සිංහල හා දෙමළ ජනයා අතර සාමකාමී සම්බන්ධතා පවත්වාගෙන ගිය නිසා ඔහු වැසියන් අතර ජනප්‍රිය වී ය.

ක්‍රි.ව. 1347 තරමේ සිට ගම්පොළ රාජ්‍ය සමය තුළ යාපනයේ සිටි ආර්ය චක්‍රවර්තී අවස්ථා දෙකක දී දකුණට ආක්‍රමණ එල්ල කළ බව නිකාය සංග්‍රහයේ හා රාජාවලියේ සඳහන් වේ. ක්‍රි.ව. 1360 වන විට පුත්තලමේ සිට පානදුරය දක්වා මුහුදු තොටුපොළ ආර්ය චක්‍රවර්ති තමා යටතට ගෙන ගියේ ය. මේ අවස්ථාවේ නිශ්ශංක අලගක්කෝනාර සෙන්පතියා කෝට්ටේ බලකොටුව පිහිටුවා එහි මුරකාවල් තරකර පානදුරයේ සිට උතුර දක්වා තොටුපලවල් අල්ලා ගත්තේ ය.

ක්‍රිව. 1390 දී පමණ ආර්ය චක්‍රවර්ති උතුරෙන් ගොඩබිම හරහා එක් සේනාවක් ද, බටහිරින් වත්තල කොළඹ දක්වා තවත් සේනාවක් ද, පිටත් කර යැවී ය. ගම්පොළ රජුගේ සේනාව, ගොඩබිමින් පැමිණි සේනාව ද, අලගක්කෝනාර සෙනෙවියා මුහුදුබඩින් පැමිණි සේනාව ද පලවා හැරියහ.

පහළොස්වන සියවස ආරම්භ වන විට දකුණු ඉන්දියාවේ විජයනගර් අධිරාජ්‍යයට යාපනය ප්‍රාදේශීය රාජ්‍යය යටත් ව පැවති බව සමකාලීන මූලාශ්‍රයවලින් හෙළි වේ. විජයනගර් රාජ්‍යයේ දෙවන හරිහර රජුගේ කාලයේ ලංකාව ඇතුළු රාජ්‍ය කිහිපයක් ආක්‍රමණය කළ බව ආලම්පූරි සන්නසේ සඳහන් වේ. ලංකාවේ උතුරේ ප්‍රාදේශීය රාජ්‍ය මෙම ආක්‍රමණයෙන් පසු විජයනගර් රාජ්‍යයට යටත් වී ය.

විජයනගර් හමුදාවේ උදව් ඇති ව යාපනය පාලනය කරමින් සිටි ආර්ය චක්‍රවර්තීට එරෙහි ව කෝට්ටේ VI වන පරාක්‍රමබාහු රජතුමා සපුමල් කුමාරයා යවා ආක්‍රමණයක් දියත් කර ඇත. ක්‍රි.ව. 1449 දී පමණ සිදු වූ මෙම ආක්‍රමණයෙන් කණකශූරිය ශිංගෛ ආරියන් දකුණු ඉන්දියාවට පලාගිය අතර යාපනය ඇතුළු උතුරු ලංකාව කෝට්ටේ රජුට අයත් විය. ඉන්පසු යාපනයේ පාලකයා ලෙස සපුමල් කුමරු පත් කෙරිණි. දකුණු ඉන්දියාවට පලා ගිය කණකශූරිය ශිංගෛ නැවත සේනා සමග පැමිණ යාපා පටුන ජයගත් බව යාල්පාන වෛපවමාලෙ කෘතියේ සඳහන් වේ. කණකශූරිය ආරියන්ගෙන් පසු පරරාජසේකරම් ද, ඉන්පසු සංකිලි ද යාපනයේ රජ වූහ. පසුව ක්‍රි.ව. 1621 දී යාපන රාජ්‍යය පෘතුගීසීන් යටතට පත් වී ය.

## ගම්පොළ රාජධානිය (ක්‍රි.ව. 1341 - 1415)

### ගම්පොල රාජධානියක් ලෙස තෝරා ගැනීමට හේතු

- අග නගරය වීමට පෙර උපනගරයක් ව පැවතීම
- කඳු කිහිපයකින් වට වූ තැනිතලා බිමක පිහිටා තිබීම
- ශ්‍රී පාද මාර්ගයේ සන්ධිස්ථානයක පිහිටීම
- මහවැලි ගඟ ගලා බසින නිම්නයේ පිහිටීම

ක්‍රි.ව. 1341 දී හතරවන බුවනෙකබාහු රජු ගම්පොළ අගනුවර කර ගෙන රජකමට පත් වී ය. ඒ කාලයේ ම ඔහුගේ සහෝදර පස්වන පරාක්‍රමබාහු කෑගලු දිස්ත්‍රික්කයේ දැදිගම පාලනය කළේ ය. මේ යුගයේ ම අලකේශ්වර නම් ප්‍රභූ පරම්පරාවක් කලුතර දිස්ත්‍රික්කයේ රයිගම බලවත් වී සිටියේ ය. ගම්පොළ රජ පවුල හා සම්බන්ධතා පැවැත්වූ තවත් ප්‍රධාන ප්‍රභූ පවුලක් වශයෙන් සේනලංකාධිකාර සෙනෙවිරත් පවුල හැඳින්විය හැකි ය.

ගම්පොළ රාජධානියේ හැම රජකෙනෙකු ම රාජ්‍යත්වයට පත්වීමට පෙර යුවරාජ තනතුර දරා ඇත. හතරවන බුවනෙකබාහු රජුට සේනාලංකාධිකාර සෙනෙවිරත් නමින් ප්‍රබල ඇමතිවරයෙක් වී ය.

සිව්වන බුවනෙකබාහුගෙන් පසු ගම්පොළ රජු බවට පත් වූයේ පස්වන පරාක්‍රමබාහු රජ ය. මොහුගේ ද අගමැති වශයෙන් සේනාලංකාධිකාර සෙනෙවිරත් පත් කර ගත් අතර ඔහු දකුණේ ආගමික කටයුතු මෙහෙයවමින් පරාක්‍රමබාහු රජුට සහාය වී ය.

ක්‍රි.ව. 1358 දී පමණ වික්‍රමබාහු නම් කුමාරයෙක් නිශ්ශංක අලගක්කෝණාරගේ උපකාරය ඇති ව කැරැල්ලක් මෙහෙයවා ගම්පොළ සිහසුන පැහැර ගෙන තුන්වන වික්‍රමබාහු නමින් රජ වී ය.

මේ කැරැල්ල සඳහා උතුරේ ආර්ය චක්‍රවර්ති සහාය වූ බව පිළිගැනේ. තුන්වන වික්‍රමබාහු රජුගේ අගමැති ලෙස සිටි සේනාලංකාධිකාර ඉවත් කොට නිශ්ශංක අලගක්කෝණාර පත්කර ගත්තේ ය. නොබෝ කලකින්, අගමැති තනතුරේ සිටිමින් රටේ දේශපාලනය මෙහෙය වූ ප්‍රධාන පුද්ගලයා බවට නිශ්ශංක අලගක්කෝණාර පත් වී ය.

මේ වන විට යාපනයේ පාලකයා ව සිටි ආර්ය චක්‍රවර්ති මන්නාරමේ සිට පානදුරය දක්වා තොටුපලවල අයබදු රැස්කිරීමේ අයිතිය තමා යටතට ගත්තේ ය. මේ නිසා කෝට්ටේ බලකොටුව ඉදි කළ අලගක්කෝණාර ආර්ය චක්‍රවර්ති පලවා හැර බටහිර තොටුපළවල අයිතිය ලබා ගත්තේ ය.

මෙයට කුපිත වූ ආර්ය චක්‍රවර්ති නැවතත් ගම්පොළ ආක්‍රමණයක් මෙහෙය වී ය. සාර්ථක ව එයට මුහුණ දුන් අලගක්කෝණාර ආර්ය චක්‍රවර්ති පලවා හැරියේ ය.

පස්වන බුවනෙකබාහුගෙන් පසු ක්‍රි.ව. 1391 දී වීරබාහු නමැත්තෙක් රජ වී ය. මෙකල වීර අලකේශ්වර නමැත්තා රයිගම පාලකයා විය. වීරබාහු, වීර අලකේශ්වර යටත් කර ගැනීම සඳහා උත්සාහ කළ අවස්ථාවේ දී අලකේශ්වර පරාජය වී ඉන්දියාවට පලා ගියේ ය. ඉන්පසු ඉන්දියාවේ ආධාර ඇති ව වීරබාහු පරදවා වීර අල්කේශ්වර රයිගම රජ වී ය.

වීර අලකේශ්වරගේ ආධිපත්‍ය පිළිගැනීමට ගම්පොළ සේනාලංකාධිකාර සෙනෙවි ඇතුළු පිරිස අකැමැති වූ නිසා සේනාලංකාධිකාරගේ මුණුබුරකු වූ පරාක්‍රම ඇපා ගම්පොළ රජ වූ බව අස්ගිරි තල්පතේ සඳහන් වේ.


මෙකල චීනයේ යුංලෝ අධිරාජයා විසින් චෙංහෝ සෙන්පතියා යටතේ විශාල නාවික හමුදවක් ඉන්දීය සාගර කලාපයට එවන ලද අතර ක්‍රි.ව. 1405 දී ඔවුහු ශ්‍රී ලංකාවට පැමිණියහ. වීර අලකේශ්වර මොවුන් නොපිළිගත්තේය. ඔවුහු 1411 දී නැවතත් ශ්‍රී ලංකාවට පැමිණියහ. මේ අවස්ථාවේ දී චෙංහෝ සෙන්පතියා වීර අලකේශ්වර සමග සටන් කොට ඔහු පරාජය කර සිරකරුවෙකු ලෙස චීනයට ගෙන ගිය බව සඳහන් වේ. චීන අධිරාජයා සිය නියෝජිතයා ලෙස පරාක්‍රම ඇපා නම් කළේ ය.

ක්‍රියාකාරකම

**ගම්පොළ රාජ්‍යයේ දේශපාලන ඉතිහාසයේ වැදගත් සිද්ධි අනුපිළිවෙළින් ගොනු කරන්න.**

## කෝට්ටේ රාජධානිය (ක්‍රි.ව. 1415 - 1521)

කෝට්ටේ පුරවරය සැලසුම් සහගත ව සකස් කරන ලද්දේ නිශ්ශංක අලගක්කෝණාර විසිනි. මෙසේ ආරම්භ වූ කෝට්ටේ රාජධානියේ ශ්‍රේෂ්ඨතම පාලකයා වූයේ හයවන පරාක්‍රමබාහු රජු ය. ක්‍රි.ව. 1415 සිට 1467 දක්වා වසර 53ක් රජකළ හයවන පරාක්‍රමබාහු රජු මුළු ලංකාව ම එක්සේසත් කළ පාලකයෙක් වී ය.



**රූපය 5.2 -කෝට්ටේ පැරණිනගරය**

## හයවන පරාක්‍රමබාහු රජු සමයේ වැදගත් දේශපාලන සිදුවීම්

- යාපන රාජ්‍යය, වන්නි ප්‍රදේශ ඈඳ ගැනීමත් මලය රටෙහි හටගත් කැරැල්ලක් මැඩලීමත් සිදු වී ය
- වන්නි ප්‍රදේශවල ස්වාධීන ව නැගී සිටි නායකවරුන් අවනත කිරීම
- යාපනයේ පාලකයා ලෙස සපුමල් කුමරු පත් කිරීම
- පරාක්‍රමබාහු රජතුමා විජයනගර් අධිරාජ්‍යයේ තොටුපොළක් ආක්‍රමණය කිරීම
- ක්‍රි.ව. 1462 දී උඩරට ජෝතිය සිටාණන් ඇති කළ කැරැල්ල මැඩලීමට අම්බුළුගල කුමරු යැවීම
- වෙළෙඳ ගනුදෙනුවක් මුල් කරගෙන දකුණු ඉන්දියාවේ අදිවිරරාම පටුන ආක්‍රමණය කිරීම

ක්‍රි.ව. 1467 දී හයවන පරාක්‍රමබාහු රජතුමා මිය ගිය විට එතුමාගේ දියණියගේ පුතා වූ ජයබාහු කුමරා කෝට්ටේ රජකමට පත් වී ය. තමාට රජකම නොලැබීම නිසා කෝපයට පත් වූ යාපනයේ පාලක සපුමල් කුමරු කෝට්ටේ පැමිණ ජයබාහු මරා ක්‍රි.ව. 1469 දී හයවන බුවනෙකබාහු නමින් රජ වී ය.

හයවන බුවනෙකබාහු රජුගේ රාජ්‍යත්වයට විරුද්ධ වූ පස්දුන් කෝරළයේ කැකුලන්දෙළ සිරිවර්ධන පතිරාජ හා කැරගම හිමි වැනි ජන ප්‍රධානීහු හයවන බුවනෙක බාහුට විරුද්ධ ව සටනක් මෙහෙය වූහ. මෙය සිංහල පෙරළිය, "සිංහල සංගය" නමින් හැඳින් විණ. හයවන බුවනෙකබාහු මෙම කැරැල්ල මැඩ පවත්වා කැරැළිකරුවන් සිරගත කෙළේ ය. හයවන බුවනෙකබාහුගෙන් පසු ඔහු පුත් හත්වන පරාක්‍රමබාහු රජ වී ය. එය නොඉවසූ අම්බුලුගල කුමරු කෝට්ටේට පැමිණ හත්වන පරාක්‍රමබාහු මරා අට වන වීර පරාක්‍රමබාහු නමින් ක්‍රිව. 1490 දී කෝට්ටේ රජ වී ය.

**ක්‍රියාකාරකම**

**කෝට්ටේ රාජධානියේ ශ්‍රේෂ්ඨතම පාලකයා හයවන පරාක්‍රමබාහු ය" මේ පිළිබඳ ඔබේ අදහස් කවියට නගන්න.**

## ආර්ථික රටාවේ වෙනස්වීම

රජරට ප්‍රදේශයේ ජීවත් වූ ජනතාව රාජධානි වෙනස්වීමත් සමග විවිධ ප්‍රදේශවලට සංක්‍රමණය විය. නව භූගෝලීය පරිසරයන්ට මුහුණ දීමට ඔවුන්ට සිදු විය. දුර්ග ආශ්‍රිත ප්‍රදේශ රාජධානි ලෙස තෝරා ගත් නිසා මහාවැව් හා වාරිමාර්ග ඉදිකිරීමට පෙළඹුනේ නැත. මේ නිසා කෘෂිකාර්මික කටයුතු සඳහා අහස් දිය යොදා ගැනීමට සිදු වීය. ප්‍රධාන වගාව වී වගාව වී ය. ජල හිඟ ප්‍රදේශයන්හි හේන් ගොවිතැන ද, මඳක් උස්බිම්වල පොල්, කොස්, පුවක්, බුලත්, ගම්මිරිස් වැනි බෝග ද වගා කරන ලදී.

තෙත් කලාපීය වෙරළබඩ ප්‍රදේශවල පොල් වගාව ව්‍යාප්ත වී ය. නිදසුන් වශයෙන් කළුතර, බෙන්තොට, තොටගමුව, මොරටුව, කැලණිය, කැරගල වැනි ප්‍රදේශවල පොල් උයන් ද පැවැති බව සඳහන් වේ. මේ නිසා පොල් තෙල් භාවිතය ජනප්‍රිය විය.

තෙත් කලාපයේ වනගත ව වැඩුණු කුරුඳු වෙළෙඳ බෝගයක් ලෙස ප්‍රසිද්ධ විය. පුවක්, ගම්මිරිස්, සාදික්කා, එනසාල් වැනි තෙත් කාලපීය බෝගවල අතිරික්තය අපනයනය සඳහා ද යොමු කෙරිණි. මුතු මැණික්, ඇතුන්, ඇත්දළ, මෙරටින් අපනයනය කළ තවත් වෙළඳ භාණ්ඩ කිහිපයකි. ක්‍රම ක්‍රමයෙන් ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පැවැති කෘෂි ආර්ථික රටාව වාණිජ ආර්ථික රටාවකට නැඹුරු වීම දක්නට ලැබිණ. ඉන්දියාව, අරාබිය, චීනය, පර්සියාව, ඊජිප්තුව යන රටවල් මෙසේ වෙළෙඳාම හා සම්බන්ධ වූ රටවල් ලෙස වැදගත් විය.

විදේශ වෙළඳාම රජුගේ ඒකාධිකාරය යටතේ පැවතිණි. චීනයෙන් ශ්‍රී ලංකාවට පිඟන් භාණ්ඩ ආනයනයන කළ බවට දැදිගම ප්‍රදේශයෙන් ලැබුණ පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍යවලින් පෙනේ. ඉන්දියාවෙන් කසී සළු ආනයනය කර ඇත. අභ්‍යන්තර වෙළෙඳාම හා සම්බන්ධ වූ කඩ වීදි තිබූ බව "කුරුණෑගල විස්තරය" නම් පුස්කොළ පොතේ සඳහන් වේ. දඹදෙණිය යුගයේ කාසි භාවිත කළ බවට සාධක හමුවේ. අභ්‍යන්තර වෙළෙඳාම හා සම්බන්ධ වූ මාර්ග පද්ධතියක් තිබූ බව පැහැදිලි ය.

## ජන ජීවිතයේ ඉස්මතු ව පෙනුණු ලක්ෂණ

- රැකියා අනුව බෙදී ගිය කුල ක්‍රමයක් පැවතීම
- ආවාහ විවාහ කටයුතු කුල අනුව සිදු වීම
- පීතෘ මූලික සමාජයක් පැවතීම
- එක් එක් පුද්ගලයාගේ සමාජ තත්ත්වය අනුව ගේ දෙර ප්‍රමාණය තීරණය වීම
- ආගමික හා ශාස්ත්‍රීය කටයුතුවල කාන්තා දායකත්වය උදා : උලකුඩය දේවිය, පද්මාවතී දේවිය
- පංච කෙළිය, ඔංචිලි පැදීම වැනි විවිධ ජනක්‍රීඩා පැවතීම
- වෙසක්, පොසොන්, ඇසළ වැනි විවිධ ආගමික උත්සව පැවතීම
- නම් තැබීම, බත් කැවීම, විවාහය හා මරණය වැනි අවස්ථාවල දී සිරිත් විරිත් අනුගමනය කිරීම

## ආගම, සාහිත්‍ය, කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය

කාලිංග මාඝගේ ආක්‍රමණය නිසා රජරට සිටි භික්ෂූන් වහන්සේලා රුහුණට හා මායා රටට වැඩම කර වූහ. දඹදෙණි යුගයේ තුන්වන විජයබාහු රජු විසින් දඹදෙණියේ විජය සුන්දරාරාමය හා බෙලිගල දළඳ මාලිගාව ඉදිකිරීම, කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කිරීම ආදිය කරන ලදී. එතුමා ආරක්ෂාව සඳහා විදේශගත වූ භික්ෂූන් ගෙන්වා සංඝ කතිකාවතක් පිළියෙළ කර වී ය.

විසුද්ධිමග්ග සන්නය, කව්සිළුමිණ, සද්ධර්මරත්නාවලිය, භේසජ්ජ මඤ්ජුසාව, සමන්ත කූටවර්ණනාව වැනි පොත් පත් රචනා කිරීම මෙම යුගයේ සිදු විය. ප්‍රකට සාහිත්‍යධරයකු වූ දෙවන පරාක්‍රමබාහු රජතුමා කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලැබීම මෙයට නිදසුනකි. ගම්පොළ යුගයේ ආරම්භයත් සමග ඇති වූ සාහිත්‍ය උන්නතිය නිසා සන්දේශ සාහිත්‍යයේ ආරම්භය සිදු විය.



රූපය 5.4 - ලංකාතිලක විහාරය

මයුර සන්දේශය, තිසර සන්දේශය, එළු අත්තනගලු වංසය, සද්ධර්මාලංකාරය, නිකාය සංග්‍රහය යන ග්‍රන්ථ ගම්පොළ යුගයේ දී ලියවුණු ප්‍රකට ග්‍රන්ථ වේ.

කෝට්ටේ යුගයේ දී තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වීදගම මෛත්‍රීය හිමි, කැරගල වනරතන හිමි, හයවන පරාක්‍රමබාහු රජතුමා හා නන්නුරුතුනයා වැනි උගත්තු බිහි වූ හ. පරෙවි සන්දේශය, ගිරා සන්දේශය, සැළලිහිණි සන්දේශය, කෝකිල සන්දේශය, හංස සන්දේශය ගුත්තිල කාව්‍යය, කාව්‍යශේඛරය, බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව, පැරකුම්බා සිරිත, ආදිය කෝට්ටේ යුගයේ ලියවුණු ප්‍රකට ග්‍රන්ථ වේ. කෝට්ටේ යුගයේ සාහිත්‍යයේ විවිධත්වයක් දැකිය හැකි ය. සන්දේශ කාව්‍ය, භක්ති කාව්‍ය, සිලෝකාව්‍ය, හටන් කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, කෝෂ ග්‍රන්ථ, උපදේශ කාව්‍ය, ආදී බොහෝ කෘති ලියවිණි. මේ නිසා ඇතැම්හු කෝට්ටේ යුගය සාහිත්‍යයේ ස්වර්ණමය අවධිය ලෙස ද හඳුන්වති. හයවන පරාක්‍රමබාහු රජු සාහිත්‍යකාමියෙකු වීමත් රාජ අනුග්‍රහය සාහිත්‍යයට ලැබීමත් රටේ දේශපාලන හා ආර්ථික දියුණුවත් මෙකල සාහිත්‍ය දියුණුවට බලපෑවේ ය.



රූපය 5.5 - යාපහුව බුදු පිළිමය

වීදගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන කරවා චෝල දේශයෙන් වැඩම කළ මහා සංඝයාට පූජා කර ඇත්තේ කුරුණෑගල යුගයේ හතරවන පරාක්‍රමබාහු රජ සමයේ දී ය. හයවන පරාක්‍රමබාහු රජු තම මෑණියන් සිහිවීම පිණිස පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන කරවී ය. වීදගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවෙන, දෙවිනුවර ඉරුගල් කුලතිලක පිරිවෙන ආදී අධ්‍යාපන මධ්‍යස්ථානයන්හි දියුණුවට රජවරුන්ගේ අනුග්‍රහය ලැබුණ නිසා පිරිවෙන් අධ්‍යාපනය දියුණු විය.

ගෘහ නිර්මාණ ශිල්පය ගැන බලන විට යාපහුව රාජධානි සමයේ දී දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ශිල්පයේ බලපෑම දක්නට ලැබේ. යාපහුව පර්වතය පාමුල රජමාලිගයක යැයි සැලකෙන නටඹුන් හමු වී ඇත. එහි පිය ගැට පෙළ කළු ගලෙන් නිර්මාණය කර ඇත. එහි ඇති සිංහ රූපය ද දක්ෂ කලා නිර්මාණ ලෙස අගය කළ හැකි ය. යාපහුවේ දළඳ මාලිගය අසල ධ්‍යාන මුද්‍රාවෙන් වැඩ හිඳිනා බුදු පිළිමයක් දක්නට ඇත.

ගම්පොළ රාජධානි සමයේ ගෘහ නිර්මාණ ශිල්පයේ ඉස්මතු ව පෙනෙන ලක්ෂණයක් වන්නේ බෞද්ධ හින්දු ගෘහ නිර්මාණ ශිල්පයේ සංකලනයෙන් ගොඩනැගිලි නිර්මාණය වීම ය. ගඩලාදෙණි විහාරය, ඇම්බැක්කේ විහාරය, ලංකාතිලක විහාරය, මීට නිදසුන් ය. විහාර ආශ්‍රිත ව දේවාල සෑදීම ද මේ යුගයේ වැදගත් කාරණයකි.

ගෘහ නිර්මාණ ආශ්‍රිත ව කැටයම් කලාව ද ඉතා දියුණු වී ය. ඇම්බැක්කේ ලී කැටයම් හොඳ ම නිදසුනකි.

පුද පූජා උත්සව යටතේ දළඳ පෙරහැර පැවැත්වීම හා හින්දු ආගමික උත්සව පැවැත්වීම පිළිබඳ තොරතුරු හමුවේ. සෑම රජ කෙනෙකු ම දළඳ පෙරහැර පවත්වා පුද සත්කාර කර ඇත. හින්දු භක්තිකයෝ දීපාවලී, තෛපොංගල් වැනි උත්සව පැවැත් වූහ.

මූර්ති කලාව යටතේ ලෝකඩ පිළිම නෙළීම ද දක්නට ලැබිණ.

## ක්‍රියාකාරකම

☞ දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා ලංකා ඉතිහාසය හා සම්බන්ධ ගෘහ නිර්මාණ, කැටයම්, මූර්ති, ආදියෙහි පින්තූර එක් රැස්කර පින්තූර පොතක් සකස් කරන්න. අදාළ විස්තර ද එහි සටහන් කරන්න.

☞ දඹදෙණි යුගයේ සිට ගම්පොළ යුගය දක්වා බිහි වූ සාහිත්‍ය කෘති ලැයිස්තුවක් සකස් කරන්න.

### සාරාංශය

☞ කාලිංග මාඝ රජරට පාලනය කරනවිට සමකාලීන ප්‍රාදේශීය රාජ්‍ය බිහි විය.

☞ තුන්වන විජයබාහු දඹදෙණිය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරාගෙන රජ වීය.

☞ දෙවන පරාක්‍රමබාහු කාලිංග මාඝගෙන් රට මුදගෙන සාර්ථක පාලනයක් ගෙන ගියේ ය.

☞ පළමුවන බුවනෙකබාහු රජු යටතේ යාපහුව රාජ්‍යය ආරම්භ විය.

☞ හතරවන පරාක්‍රමබාහු රජු කුරුණෑගල රාජධානියේ ශ්‍රේෂ්ඨ රජ කෙනෙකි.

☞ යාපනය රාජ්‍යයේ ආරම්භකයා විජය කුලංකෙ රජු ය.

☞ ආර්ය චක්‍රවර්ති රජවරුන් දෙළොස් දෙනෙකු පමණ පාලනය කර ඇත.

☞ ගම්පොළ රාජධානියේ ප්‍රථම පාලකයා හතරවන බුවනෙකබාහු රජතුමා ය.

☞ මේ යුගයේ රජු හා සම්බන්ධතා පැවැත්වූ සේනාධිලංකාර හා අලගක්කෝණාර නමින් පෙළපත් දෙකක් පැවතිණ.

☞ කෝට්ටේ රාජ්‍යයේ ශ්‍රේෂ්ඨතම පාලකයා වූයේ අවසන්වරට ලංකාව එක්සේසත් කළ හයවන පරාක්‍රමබාහු රජු ය.

☞ මෙම යුගයේ කෘෂිකර්මය මෙන් ම බාහිර හා අභ්‍යන්තර වෙළඳාම ද ක්‍රමවත් ව සිදු විය.

☞ බුදු දහම හා හින්දු ආගම ද ව්‍යාප්ත වීය.

☞ ගෘහ නිර්මාණ ශිල්පයේ දී හා මූර්ති කලාවේ දී බෞද්ධ හා හින්දු ආගමික බලපෑම් දක්නට ඇත.

☞ බෞද්ධාගමික හා හින්දු ආගමික පුද පූජා හා උත්සව ද පවත්වනු ලැබිණි.

## අභ්‍යාස

1. පහත සඳහන් රජවරුන්ගෙන් සිදුවුණු සේවාවන් 5 බැගින් ලියන්න.
    1. තුන්වන විජයබාහු රජ
    2. දෙවන පරාක්‍රමබාහු රජ
    3. සතරවන පරාක්‍රමබාහු රජ
2. ගම්පොළ රාජධානියේ රජකළ රජවරුන්ගේ රාජ නාමාවලියක් සකස් කරන්න.
3. යාපන රාජ්‍යය පිළිබඳ තොරතුරු සපයා ගත හැකි මූලාශ්‍රය 4ක් ලියන්න.
4. දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා මේ රට ජන ජීවිතයේ ඉස්මතු ව පෙනුණු ලක්ෂණ 5ක් ලියන්න.
5. එක් එක් රාජධානි යුගවල දී ලියන ලද සාහිත්‍ය කෘතිවල නම් හා කර්තෘවරු ඇතුළත් කරමින් පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කරන්න.

| රාජධානි සමය | ග්‍රන්ථය | කර්තෘ |
|---|---|---|
| | | |

## ආශ්‍රිත ග්‍රන්ථ

☞ ශ්‍රී ලංකාවේ ඉතිහාසය II කොටස - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

☞ මධ්‍යකාලීන ලංකා ඉතිහාසය - අමරදාස ලියනගමගේ

☞ රජරට ශිෂ්ටාචාරය හා නිරිත දිග රාජධානිය - මහාචාර්ය ඉන්ද්‍ර කීර්ති සිරිවීර